# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/LH/09/ගෙවතු2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............ | දිනය<br>திகதி<br>Date | 2022.01.24 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත,

සෞභාග්‍යා ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන - 2022

**පැලතවාන් කරුවන් සඳහා පුහුණුව ලබාදීම**

උක්ත කාරණය සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.01.12 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

02. ඒ අනුව දිවයිනේ සියළුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලදී මෙම පුහුණුව 2022 පෙබරවාරි මස 05, 06 හා 07 යන දිනයන්හිදී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සූදානම් කළ යුතු වේ. මේ සඳහා අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන වල නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඉහත දින තුනෙන් එක් දිනයකදී සුදුසු පරිදි මෙම පුහුණුව පැවැත්වීමට කටයුතු කළ යුතු වේ.

03. මේ සඳහා අදාල පැල තවාන්කරුවන්, ව්‍යාපෘති කළමණාකරු, කලාප කළමණාකරුවන්, ව්‍යාපෘති සහකාර මෙන්ම අදාල වසම් වල සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහභාගී විය යුතු වේ.

04. ඊට ප්‍රථම එනම් 2022.01.31 දිනට පෙර අදාල පැල තවාන්කරුවන් පිළිබඳ නාම ලේඛනය ඇතුලත් තොරතුරු ලේඛනය ඔබගේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය අයත් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබාදිය යුතු වේ.

05. තවාන් පැල නිෂ්පාදනය සඳහා ප්ලාස්ටික් ට්‍රේ, කොහුබත් පැලට යොදා ගැනීම පිළිබඳව වැවිලි කර්මාන්ත ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා හා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා සමඟ 2022.01.18 දින පැවති සාකච්ඡාව අනුව ඉහත යෙදවුම් ලක්ෂ 5 පමණක් ලබාදිය හැකි බව දැනුම්දුන් අතර එහිදී තීරණය කළ පරිදි කුරුණෑගල, පුත්තලම හා ගම්පහ යන දිස්ත්‍රික්ක වල තවාන් පැල නිෂ්පාදනය කිරීමට ඉදිරියේදී ඒවා ලබාදීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සැලසුම් කරමින් පවතී.කෙසේ වුවද අනෙකුත් දිස්ත්‍රික්ක වල පොලිතීන් ඇසුරුම් වල අදාල පාංශු මාධ්‍ය යොදවා බටු, මිරිස්, තක්කාලි හා මාළු මිරිස් යන බෝග වර්ග වලින් එක් බෝග වර්ගයකින් පැල 10 ක් එක් ඇසුරුමක වනසේ ඇසුරුම් 04 හි පැල 40 ක් නිෂ්පාදනය කර එක් ගෙවතුලාභියෙකු වෙත ලබා දිය යුතු වේ. මේ සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුව කෘෂිකර්ම උපදේශකවරුන් මඟින් ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබාදෙන තාක්ෂණික පුහුණුවේදී ලබාදෙනු ඇත.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Batta

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகப்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 01 |

06. එමෙන්ම මහවැලි බල ප්‍රදේශ වල මෙම පැල තවාන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මහවැලි අධිකාරියේ අදාල ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ සහයෝගය ඇතිව එවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ.

07. එබැවින් ඔබ විසින් මෙම තාක්ෂණික පුහුණු වැඩසටහන සැලසුම් කර ඇති ආකාරය පිළිබඳව වන තොරතුරු ඇතුලත් දිස්ත්‍රික් වාර්තාව ඇමුණුම් අංක 01ට අදාලව සකස් කර 2022.01.28 දිනට පෙර ජීවනෝපාය සංවර්ධන අංශයේ jeevonopaya@gmail.com යන ඊමේල් ලිපිනය වෙත වාර්තා කරන මෙන් කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය - කා.දැ.ගැ.පි.
4. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය - කා.දැ.ගැ.පි.

D/Live/Se/Sawb.01.10

ඇමුණුම් අංක 01

# සෞභාග්‍යා ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන - 2022
## පැල තවාන්කරුවන් සඳහා පුහුණුව ලබාදීම
## 2022 ජනවාරි මස 05,06 හා 07

**දිස්ත්‍රික්කය:- ............................**

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ප්‍රජා මූල බැංකු ගණන | ග්‍රාම නිලධාරී වසම් ගණන | පුහුණුව ලබාදීමට අපේක්ෂිත පැල තවාන්කරුවන් ගණන | පුහුණුව ලබාදීමට අපේක්ෂිත නිලධාරීන් ගණන | පුහුණුව ලබාදීමට අපේක්ෂිත ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නම | පුහුණුව ලබාදීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

සකස් කළේ:-
දිස්ත්‍රික් සමෘද්ධි කළමණාකරු
(ජීවනෝපාය විෂයභාර)
D/Live/Sen/Sawb. Format Ane. 1

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
දිනය:-